# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,269 - 2022 පෙබරවාරි මස 25 වැනි සිකුරාදා - 2022.02.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| **ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් :** | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| **ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම :** | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| **ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඉඩම් විකිණීම :** | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 70 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 71 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2022 මාර්තු මස 18 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 මාර්තු මස 04 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

උතුරු මැද පළාත් සභාවේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, රාජාංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) පී. ජී. සුනිල් අබේකෝන් වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1982.03.29 වැනි දින ප්‍රදානය කර ඇති අංක අනු/ප්‍ර/1210 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන රාජාංගනය, යාය 12 පදිංචි චිත්‍රනයිදෙලාගේ හෙන්ද්‍රික්හාමි වෙත ප්‍රදානය කොට අනුරාධපුරය දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 1211 යටතේ 1982.06.10 වැනි දින බනුප/1/1210 පිටුවේ ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට පත්වීමට කෙනෙකු නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2022.03.18 වැනි දිනට පෙර මා වෙත ලිඛිතව දනුම් දිය යුතුය.

### උපලේඛනය

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, බටහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ ....... පත්තුවේ/කෝරළේ, 5 ඒ ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාසයේ රාජාංගනය යාය 12 නමැති ගමේ පිහිටා ඇති, අංක අ. ජ. සි. අ. 21 දරන පිඹුරේ අංක 3 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපනය කර ඇති ප්‍රමාණයෙන් රූඩ් 02 (දෙකයි) පර්. 01 (එකයි) ඇතැයි ගණන් බලා තිබෙන රාජාංගනය වත්ත යනුවෙන් හඳුන්වනු ලබන පහත සඳහන් පරිදි මායිම් වූ රජයේ ඉඩම් කට්ටිය.

| | | |
|---|---|---|
| උතුරට | : | පාර හා 2 කොටසක්, |
| නැගෙනහිරට | : | කැබලි අංක 4, |
| දකුණට | : | කැබලි අංක 35 හා 36 කොටසක්, |
| බස්නාහිරට | : | කැබලි අංක 2 කොටසක් හා 36 කොටසක්. |

පී. ජී. සුනිල් අබේකෝන්,
ප්‍රාදේශීය ලේකම්,
රාජාංගනය.

2021 නොවැම්බර් මස 22 වැනි දින.

02-273

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

දකුණු පළාත් සභාවේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඉන්දික රුවන් කුමාර විතාරණ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 2004.06.07 වැනි දින ප්‍රදානය කර ඇති අංක හම්/8/ප්‍ර 57026 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන ගලිහිටිය පදිංචි සෙනරත් පතිරණගේ දොන් කරෝලිස් වෙත ප්‍රදානය කොට අංක 1001 යටතේ 2004.10.29 වැනි දින ලියාපදිංචි කර ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට පත්වීමට කෙනෙකු නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2022.03.18 වැනි දිනට පෙර මා වෙත ලිඛිතව දනුම් දිය යුතුය.

### උපලේඛනය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, වර්තමානයේ වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් උතුරු ගිරුවා පත්තුවේ වලස්මුල්ල පහල ග්‍රාම නිළධාරි වසමේ අ. ග. පි. 163 කැබලි අංක 459 දරන හෙක්ටයාර් 0.042 ක් වූ දුනුමඩලාවහේන නමැති රජයේ ඉඩම.

| | | |
|---|---|---|
| උතුරට | : | කැබලි අංක 449 කැබැල්ල ද, |
| නැගෙනහිරට | : | කැබලි අංක 479 කැබැල්ල ද, |
| දකුණට | : | කැබලි අංක 466 කැබැල්ල ද, |
| බස්නාහිරට | : | කැබලි අංක 458 බිම් කැබැල්ල ද වේ. |

අයි. ආර්. කේ. විතාරණ,
ප්‍රාදේශීය ලේකම්,
වලස්මුල්ල.

2021 මැයි මස 13 වැනි දින.

02-274

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

වයඹ පළාත් සභාවේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) ඩී. එම්. එස්. දසනායක වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1979 සැප්තැම්බර් 21 වැනි දින ප්‍රදානය කර ඇති අංක එල්. එස්/කු 24 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන කොටදෙණියාව, තම්බි වත්ත පදිංචි දොන් ජෝන් විජේසිංහ ජයවර්ධන වෙත ප්‍රදානය කොට කුරුණෑගල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක B 558/129 යටතේ 1979 ඔක්තෝබර් 26 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද, ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තික භාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2022.03.18 දිනට පෙර මා වෙත දැනුම් දිය යුතු ය.

උපලේඛනය

කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කයේ පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හිරියාල හත් පත්තුවේ /කෝරළේ 366 ගල්ටැංවැව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ගැලෙවැව නැමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේ ජනරාල් වරයා භාරයේ ඇති සහ සර්වේ ජනරාල් වරයා විසින් සම්පාදිත අංක අ. ග. පි. 1996 දරන කට්ටි කැඩීමේ පිඹුරේ සර්වේ ජනරාල් විසින් සම්පාදිත අංක 51/67 දරන රේඛා සටහනේ අංක 5 සහ 10 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර/අක්කර 47 (හතලිස් හතයි) රූඩ් 02 (දෙකයි) පර්චස් 39 (තිස් නවය)ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම ;

කැබලි අංක 5ට මායිම්,

| | | |
|---|---|---|
| උතුරට | : | මිරිහන්පිටිගම ගම් ඉම, |
| නැගෙනහිරට | : | අ.ග.පි. 1996 හි අංක 7 සහ 9 දරන බිම් කට්ටි, |
| දකුණට | : | අ.ග.පි. 1996 හි අංක 7 දරන බිම් කට්ටිය, |
| බස්නාහිරට | : | අ.ග.පි. 1996 හි අංක 9, 4, 3 සහ 2 දරන බිම් කට්ටි. |

කැබලි අංක 10ට මායිම්,

| | | |
|---|---|---|
| උතුරට | : | අ.ග.පි. 1996 හි අංක 9 දරන බිම් කට්ටිය, |
| නැගෙනහිරට | : | අ.ග.පි. 1996 හි අංක 11 දරන බිම් කට්ටිය, |
| දකුණට | : | අ.ග.පි. 1996 හි අංක 9 දරන බිම් කට්ටිය, |
| බස්නාහිරට | : | අ.ග.පි. 1996 හි අංක 11 සහ 1 දරන බිම් කට්ටි. |

ඩී. එම්. එස්. දසනායක,
ප්‍රාදේශීය ලේකම්,
පොල්පිතිගම.

2021 ඔක්තෝබර් මස 27 වැනි දින.

02-280

---

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/67820.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :
එන්සීපී/පීඑල්සී/එල්09/01/18/04.

### 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, රඹෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 116, කදුරුගස්දමන ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, කදුරුගස්දමන ගමේ ඉඩම් නිලධාරී විසින් සකසන ලද දළ අනුරේඛනයේ දැක්වෙන ප්‍රමාණයෙන් අක්. 04, රූඩ් 01, පර්. 30.38 ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් කෘෂිකාර්මික කටයුතු සඳහා උමගිලියගේ නයනා ප්‍රියංගනී මහත්මිය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත දක්වේ.

| | | |
|---|---|---|
| *උතුරට* | : | කදුරුගස්දමන රජයේ කැලය, |
| *නැගෙනහිරට* | : | කදුරුගස්දමන රජයේ කැලය, |
| *දකුණට* | : | ගුරු පාර හා රජයේ කැලය, |
| *බටහිරට* | : | පාරම්පරික හේන් ඉඩම් හා රජයේ කැලය. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි (30) (2021.11.01 සිට ඉදිරියට).

(ආ) *වාර්ෂික බදු මුදල*.- 2021 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000)

වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2021 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2%කි. 2021 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) ට වඩා වැඩිවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2021 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අය කළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතු විය යුතු ය.

*වාර මුදල.* - වාර මුදලක් අය නොකෙරේ.

*(ඇ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය.

*(ඈ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම කෘෂිකාර්මික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

*(ඉ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* 2021.11.01 වැනි දින සිට අවුරුදු 05 ක් ගතවන තුරු මෙම ඉඩම ඇතුරු බදු හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ. ඉන්පසු වුව ද, අතුරු බදු හෝ පැවරීම් කළ හැක්කේ මෙම ඉඩම් බදුගත් කාරණය සඳහා පමණි.

*(ඌ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට් නිවේදනය* පළ කළ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ඒ. කේ. එන්. සෙව්වවන්දි අමරසේකර,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2022 පෙබරවාරි මස 25 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර, ''මිහිකත මැඳුර'',
ඉඩම් මහලේකම් කාර්යාලයේ, අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

02-260

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/68367.
ඉඩම් කොමසාරිස්ගේ අංකය (අම්පාර) :
අම්/ඉකො/ඉ/මිහි/වාණි/26.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

අම්පාර දිස්ත්‍රික්කයේ, අම්පාර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මිහිඳුපුර ග්‍රාම නිලධාරි වසමේ මිහිඳුපුර ගමේ පිහිටි පිඹුරු අංක 280009 හි කැබලි අංක 14 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.8060 ක් පමණ වූ රජයේ ඉඩම කැබැල්ල වාණිජ පදනමින් බුලත්සිංහල හෙට්ටිගේ සුරංග මයා විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| *උතුරට* | : | PP/අම්/1174 හා කැබලි අංක 11,10,09,08,15, |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 15, |
| *දකුණට* | : | කැබලි අංක 15, |
| *බටහිරට* | : | කැබලි අංක 15 හා PP/අම්/1174. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

*(අ)* *බදු කාලය .*- අවුරුදු තිහයි (30) (ගරු ඇමතිතුමා අනුමත කළ 2021.12.10 දින සිට ඉදිරියට).

*(ආ)* *වාර්ෂික බදු මුදල.*- 2021 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2%කි. 2021 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) ට වඩා වැඩිවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතු ය.

*වාර මුදල.* - වාර මුදලක් අය නොකෙරේ.

*(ඇ)* මෙම ඉඩම වාණිජ කටයුතු සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

*(ඈ)* මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී පළාත් ඉඩම් කොමසාරිස්/ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතු ය.

*(ඉ)* පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

*(ඊ)* සාද ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඌ)* බද්ද ක්‍රියාත්මක වන දින සිට වසර 05ක් ගත වන තුරු අතුරු බදු හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(එ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙම නිවේදනය පළ වූ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

සමීර පී. හෙට්ටිආරච්චි,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2022 පෙබරවාරි මස 25 වැනි දින,
අංක 1200/6 හි, ඉඩම් මහලේකම් කාර්යාලය,
''මිහිකත මැදුර'',රජමල්වත්ත පාර, බත්තරමුල්ල,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

02-272

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.